# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 අගෝස්තු මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016.08.15 දින නිකුත් කරන ලදී)**

# අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මගින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත, ඒ පනතට 37අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වන්නේ, ප්‍රකාශ සටහන් කරගනු ලැබූ නමුත් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු නොලැබූ, පොලිස් අත්අඩංගුවේ සිටින තැනැත්තකුට, ඔහුගේ වියදමින් ඔහු විසින් තෝරා ගනු ලබන නීතිඥවරයකුගේ සේවය හා උපදෙස් ලබා ගැනීමට හෝ ඒ නීති උපදෙස් සඳහා යන වියදම දැරීමට ඔහුට නොහැකි අවස්ථාවක නීති ආධාර කොමිෂන් සභාවේ සහාය මත නීතිඥවරයකුගේ සේවය සහ උපදෙස් ලබා ගැනීමට ඇති අයිතිය සහතික කිරීමට විධිවිධාන සැලසීම වේ.

# අපරාධ නඩු විධාන සංග්‍රහය
## (සංශෝධන)

එල්.ඩී.—ඕ. 2/2016.

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2016 අංක    දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 37 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය එම සංග්‍රහයේ 37අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— 1979 අංක 15 දරන පනතට 37අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"සිර භාරයට ගනු ලැබූ තැනැත්තකුට නීතිඥවරයකුගේ සේවය සහ උපදෙස් ලබා ගැනීමට ඇති අයිතිය.

37අ. (1) සිර භාරයට ගනු ලැබ පොලිස් අත්අඩංගුවේ රඳවා තබා ගෙන සිටින යම් තැනැත්තකුට, 110 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව එම තැනැත්තාගේ ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් පසු සහ ඔහු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමට පෙර එම තැනැත්තාගේ වියදමින් තමා විසින් තෝරා ගනු ලබන නීතිඥවරයකුගේ සේවය සහ උපදෙස් ලබා ගැනීමට අයිතිය ඇත්තේ ය.

(2) තමාගේ වියදමින් නීතිඥවරයකුගේ සේවය සහ උපදෙස් ලබා ගැනීමට තමාට හැකියාවක් නොමැති බව එසේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා විසින් අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයාට දැනුම් දෙනු ලැබුවහොත්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 27 දරන නීති ආධාර පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සේවය එම තැනැත්තාට ලබා දීමට නීති ආධාර කොමිෂන් සභාවට හැකියාව ඇත්නම් එම කොමිෂන් සභාවේ නීතිඥවරයකුගේ සේවය එම තැනැත්තාට ලබා දිය යුතු ය.

2—PL 010095—425 (2016/07)

(3) (2) වන උපවගන්තියේ සඳහන් සේවය ලබාදෙන ලෙස අදාළ පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් නීති ආධාර කොමිෂන් සභාවෙන් ඉල්ලීමක් කළ යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.